සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**10 - ශ්‍රේණිය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය -I, II**

**නම/විභාග අංකය : ................................................................. කාලය : පැය 03 යි.**

## I පත්‍රය

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' x' ලකුණ යොදන්න.**

01. මිනිස් අවශ්‍යතා පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. ආහාර, නිවාස, පොත්පත්
2. ආහාර, නිවාස, ඇඳුම්
3. නිවාස, අධ්‍යාපනය, තට්ටුගෙවල්
4. ආහාර, ඇඳුම්, උපකාරක පන්ති

02. භාණ්ඩයකට හා සේවාවකට නිදසුන් ලෙස දැක්වෙන පිළිතුර වන්නේ,

1. ප්‍රවාහනය, රක්ෂණය
2. සන්නිවේදනය, බැංකු සේවය
3. බෙහෙත්, වෛද්‍ය සේවය
4. ආහාර, බත්

03. ව්‍යාපාර ආයතනයක් සතු කළමනාකරුවන් හා ගොඩනැගිලි අයත්වන නිෂ්පාදන සාධක දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. ශ්‍රමය, ප්‍රාග්ධනය
2. ශ්‍රමය, භූමිය
3. ප්‍රාග්ධනය, භූමිය
4. ව්‍යවසායකත්වය, ප්‍රාග්ධනය

04. "ව්‍යාපාරයක .......①...... ප්‍රමාණවත් ලාභයක් ලබාගැනීම පිළිබඳව උනන්දුවක් දක්වන අතර .......②...... ලැබිය යුතු බදු ආදායම් නිසිලෙස ලබාගැනීම පිළිබඳව උනන්දුවක් දක්වති."

ඉහත ප්‍රශ්නයේ ① හා ② යන ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අයිතිකරුවෝ, ණයදෙනුකරුවෝ
2. සේවකයෝ, කළමනාකරුවෝ
3. අනාගත ආයෝජකයෝ, මූල්‍ය ආයතන
4. අයිතිකරුවෝ, රජය

05. පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරය අයත් සාධක කිහිපයකි.

A - අයිතිකරුවෝ
B - ගණුදෙනුකරුවෝ
C - සැපයුම්කරුවෝ
D - සේවකයෝ
E - තරගකරුවෝ
F - කළමනාකරුවෝ

ඉහත සාධක අතරින් බාහිර පරිසරයට අයත් සාධක පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

1. A, B, C
2. B, C, E
3. B, D, E
4. D, E, F

06. පොළී අනුපාතය, උද්ධමනය, ඉතුරුම් යනාදී සාධක ඇතුලත්වන ව්‍යාපාර පරිසරය වන්නේ,

1. ආර්ථික පරිසරයයි
2. දේශපාලන පරිසරයයි
3. තාක්ෂණික පරිසරයයි
4. ගෝලීය පරිසරයයි

07. ''ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම උදෙසා නව යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව රජයේ අවධානය යොමු වී ඇත.''

ඉහත ප්‍රකාශය හා සම්බන්ධ පරිසර සාධකය කුමක් ද?

1. නෛතික පරිසරය
2. තාක්ෂණික පරිසරය
3. ගෝලීය පරිසරය
4. දේශපාලන පරිසරය

08. රටක ජාතික ආදායම එරට ජනතාව අතර බෙදීගොස් ඇති ආකාරය හඳුන්වන්නේ,

1. උද්ධමනය
2. ආදායම් ව්‍යාප්තිය
3. ඉතුරුම්
4. රැකියා නියුක්තිය ලෙසිනි

09. ''වර්තමානයේ නිෂ්පාදන ක්‍රියාවලි පරිගණකගත කළ යන්ත්‍රසූත්‍ර මඟින් සිදුකර ගැනීම දක්නට ඇත.'' මේ හා සම්බන්ධ පරිසර සාධකය කුමක් ද?

1. ආර්ථික පරිසරය
2. නෛතික පරිසරය
3. තාක්ෂණික පරිසරය
4. දේශපාලන පරිසරය

10. ''ජනක'' ව්‍යාපාරයේ කළමනාකරු ව්‍යාපාර ක්ෂේත්‍රයේ කටයුතු කර ඇති දක්ෂ පළපුරුදු අයෙකි. මෙය එම ව්‍යාපාරයට,

1. ශක්තියකි
2. අභියෝගයකි
3. අවස්ථාවකි
4. තර්ජනයකි

11. ව්‍යාපාරයක ශක්තීන් හා අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

A - පුහුණු සේවකයින්
B - පළපුරුදු කළමනාකරුවන්
C - ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම
D - සුවිශේෂී නිෂ්පාදන ක්‍රම
E - ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක ඉවත් කිරීම
F - නව නගර නිර්මාණය

මෙහි සඳහන් අවස්ථා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A, B, D
2. B, C, E
3. C, E, F
4. C, D, F

12. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි අවස්ථාවක් හා තර්ජනයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අධිවේගී මාර්ගය ඉදිකිරීම - අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය පිරිහීම

2. අඩුපොළී ණය ක්‍රම - සේවකයින්ගේ අයහපත් ආකල්ප

3. ව්‍යාපාරවලට හිතකර නීතිරීති - තරඟකරුවන් බිහිවීම

4. ගැලපෙන භූගෝලීය පිහිටීම - ස්වාභාවික ආපදා

13. ව්‍යාපාරයක පරිසරය අධ්‍යයනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ' X' තීරුවෙන් ද ඊට අදාල නිදසුන් කිහිපයක් ' Y' තීරුවෙන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1 ශක්තීන්<br>2 දුර්වලතා<br>3 අවස්ථා<br>4 තර්ජන | A රජය අඩුපොළී ණය ක්‍රම හඳුන්වා දීම<br>B ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම<br>C නව තාක්ෂණයට අනුගත වීම දුෂ්කර වීම<br>D සේවකයින්ගේ අයහපත් ආකල්ප |

''X'' තීරුවේ පරිසර අධ්‍යයනය කිරීමේ වැදගත්කම හා ''Y'' තීරුවේ සඳහන් නිදසුන් සමඟ අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. A, B, D, C
2. B, D, A, C
3. A, C, B, D
4. B, C, A, D

14. ව්‍යාපාරයකට යොදවනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණය, සේවක සංඛ්‍යාව ආදී සාධක පදනම් කරගෙන ව්‍යාපාර සංවිධාන වර්ගකර දක්වනු ලබන්නේ,

1. හිමිකාරීත්වය මතය
2. අරමුණ මතය
3. ව්‍යාපාර ස්වභාවය මතය
4. පරිමාණය අනුව

15. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සිංවිධාන වර්ගවලට අයත් නිදසුන් කිහිපයකි.

A - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
B - සමඟි ස්ටෝර්ස්
C - නිල්මිණි ක්‍රීඩා සමාජය
D - ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
E - සීමා සහිත කෝසල සමාගම
F - අමාරිස් සහ පුත්‍රයෝ

ඉහත ව්‍යාපාර අතුරෙන් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර වන්න්,

1. A, B, C,E
2. B, C, E, F
3. B, D, E, F
4. A, B, E, F

16. පහසුවෙන් ආරම්භ කළ හැකි, ස්වාධීන තීරණ ගැනීමට හැකියාවක් පවතින ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්ද?

1. ඒක පුද්ගල ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. සංස්ථාපිත සමාගම්
4. සමූපකාර සමිති

17. ව්‍යාපාරයක් සහ වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් මුදලට හුවමාරුවීම හඳුන්වනු ලබන්නේ,

1. වියදම් වශයෙනි  2. ගණුදෙනු වශයෙනි

3. වත්කම් වශයෙනි  4. වගකීම් වශයෙනි

18. ව්‍යාපාර ආයතනයක විවිධ වත්කම් දැකිය හැකිය. ඒ අනුව ජංගම නොවන වත්කම් ලෙස සැලකිය හැක්කේ,

1. ඉඩම්, බඩුතොගය, ලීබඩු  2. යන්ත්‍ර, ණයගැතියෝ, ඉඩම්

3. ලීබඩු, මුදල්, මෝටර්රථ  4. ගොඩනැගිලි,යන්ත්‍රෝපකරණ,මෝටර්රථ

19. විකිණීම සඳහා ණයට ගැනීමේ දී බිහිවන ණයහිමියන් අයත් වන්නේ,

1. ජංගම වගකීම් වලටය  2. ජංගම වත්කම් වලටය

3. ජංගම නොවන වගකීම් වලටය  4. ජංගම නොවන වත්කම් වලටය

20. ව්‍යාපාර අයිතිකරුවන්ගේ හිමිකම අඩුවීම බලපාන අයිතම වන්නේ,

1. ගැනිලි හා ආදායම්ය  2. ආදායම් හා වියදම්ය

3. ගැනිලි හා වියදම්ය  4. ආදායම් හා අමතර ප්‍රාග්ධනය යෙදවීම්ය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**10 - ශ්‍රේණිය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II**

**නම/විභාග අංකය : ..........................................................................**

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය අතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (1) සිට (10) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇඳුම් මැසීමේ පාඨමාලාවක් සාර්ථකව නිමකල 'සපුමලී' 2020 ජනවාරි 01 දින තම නිවසේ කොටසක ළමා ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කළාය. තමා ඉතිරි කර ගත් රු. 80 000/= ක මුදල හා බැංකුවෙන් රු. 100 000/= ක මුදලක් අඩුපොළිය යටතේ දිගුකාලීනව ගෙවීමට ලබාගෙන රෙදි මහන මැසිමක් හා රෙදිපිළි නූල් හා උපකරණ මිලට ගත්තාය. මේ සඳහා පළපුරුදු සේවිකාවක් ද රු. 30 000/= ක මාසික වැටුප යටතේ බඳවාගත් අතර ජනප්‍රිය පාසලක් අසල තම ව්‍යාපාරය පිහිටීම නිසා පළමු මාසය අවසන්වන විට ඉල්ලුම වැඩිවී ව්‍යාපාරය ඉතා සාර්ථකත්වයට පත්විය.

i. සපුමලීගේ ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාවය හා වුවමනාව දක්වන්න.

ii. ඉහත ව්‍යාපාර සංවිධානය කුමන ව්‍යාපාර සංවිධාන ක්‍රමයකට අයත්වේ ද?

iii. සපුමලීගේ ව්‍යාපාරය සාර්ථකවීමට බලපෑ ශක්තීන් දෙකක් දක්වන්න.

iv. මෙම ව්‍යාපාරයේ දක්නට ඇති අභ්‍යන්තර පරිසර සාධක 02 ක් දක්වන්න.

v. බැංකුවෙන් අඩු පොළියට ණය ලබා ගැනීම අයත්වන බාහිර පරිසර සාධකය කුමක් ද?

vi. මෙම ව්‍යාපාරය හා සම්බන්ධ අයිතිකරුගේ හිමිකම කොපමණ ද?

vii. මෙම ව්‍යාපාරයේ දක්නට ඇති වත්කම් මොනවා ද?

viii. 'සපුමලී' ගේ ව්‍යාපාරයේ ජංගම නොවන වගකීම්වල වටිනාකම කියද?

ix. මෙම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි දෙකක් දක්වන්න.

x. 'නවීන විලාසිතා පිළිබඳ පළපුරුද්දක් ඇති 'සඳුනි' එක්කරගෙන මෙම ව්‍යාපාරය පුළුල් කිරීමට සපුමලී අදහස් කරයි.' එම ව්‍යාපාර සංවිධානය කුමක් ද?

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

02. i. ''වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් වර්ධනය නිසා බොහෝ ව්‍යාපාර කටයුතු පහසු වී ඇත.'' එවැනි ව්‍යාපාර කටයුතු දෙකක් දක්වන්න.

ii. ව්‍යාපාරයක් යනුවෙන් කුමක් අදහස් වේද?

iii. අවශ්‍යතා හා වුවමනා අතර සැසඳීමක් කරන්න.

iv. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

A - මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හඳුන්වයි.

B - අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිය.

C - පෞද්ගලික අංශයේ සියලුම ව්‍යාපාර සංවිධාන වර්ග ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරයි.

D - තොග හා සිල්ලර වෙළෙඳ ආයතන සේවා සැපයීමේ ව්‍යාපාර ගණයට අයත් වේ.

03. i. පහත සඳහන් බලපෑම් ඇතිවන ව්‍යාපාර පරිසරය නම් කරන්න.

A - 2007 අංක 07 දරන සමාගම් පනත

B - විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම

C - අමු ද්‍රව්‍ය හා අනෙකුත් සේවා අඛණ්ඩව ලබා දීම

D - ජංගම දුරකථන

ii. පහත සඳහන් නිදසුන් අයත් නිෂ්පාදන සාධක නම් කරන්න.

A - රථවාහන

B - නව්‍යතා සම්පාදනය

C - ඛනිජ සම්පත්

D - ගණකාධිකාරීවරු

iii. 'බන්දුල' රජයේ රෝහලක් ආසන්නයේ වසවිස නැති දේශීය ආහාර සකස් කරන ආපනශාලවක් පවත්වාගෙන යයි. දෛනිකව විශාල පාරිභෝගික පිරිසක් ආපනශාලාවට පැමිණෙති.

අ) ඉහත ව්‍යාපාරයට අදාළ ව්‍යාපාරික අවස්ථාව දක්වන්න.
ආ) අනාගතයේ දී මෙම ව්‍යාපාරයට එල්ලවිය හැකි තර්ජනයක් දක්වන්න.

iv. වෘත්තීය පුහුණු අධිකාරිය මෙහෙයවන ලද වඩුවැඩ පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිමකළ 'නුවන්', ලීබඩු සාදා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

අ) නුවන්ගේ ව්‍යාපාරික අරමුණු දෙකක් සඳහන් කරන්න.
ආ) මෙම ව්‍යාපාරයට ඇල්මැති පාර්ශවයක් වන සැපයුම්කරුවන්ගෙන් ව්‍යාපාරය බලාපොරොත්තු වන දායකත්වයන් දෙකක් සඳහන් කරන්න.

04. i. ව්‍යාපාර සංවිධානයක් යනු කුමක් ද?

ii. ව්‍යාපාර සංවිධාන වර්ගකළ හැකි නිර්ණායක දෙකක් දක්වන්න.

iii. නිපුන තම මිතුරෙකු වූ අරුණ සමඟ ප්‍රාග්ධනය යොදා තම පුරන් වූ කුඹුර අස්වැද්දීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

අ) ඉහත ව්‍යාපාරය කිනම් ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේද?
ආ) ඉහත ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් දක්වන්න.

iv. ශිෂ්‍යයකු ලෙස ඔබට සේවා සපයන රාජ්‍ය දෙපාර්තමේන්තු 04 ක් නම් කරන්න.

## II කොටස - ගිණුම්කරණය

- ප්‍රශ්න දෙකකට පමනක් පිළිතුරු සපයන්න.

05. i. ''ගිණුම්කරණයයේ ප්‍රධානතම අරමුණ වන්නේ විවිධ පාර්ශව වලට අවශ්‍ය විවිධ තොරතුරු සැපයීමයි.''

අ) එම තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශව 04 ක් දක්වන්න.
ආ) ඉහත ප්‍රධාන අරමුණට අමතරව හඳුනාගත හැකි තවත් අරමුණු දෙකක් දක්වන්න.

ii. 'රෝසි' ගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට හිමිකම රු. 300 000/= ක් වූ අතර 2019.13.31 දිනට හිමිකම ඊට වඩා වැඩි වී ඇත. ඇගේ හිමිකම වැඩිවීමට බලපාන හේතු දෙකක් දක්වන්න.

iii. 2019.12.31 දිනට ව්‍යාපාරයක රු. 1 000 000/= ක මුළු වත්කම් ඇති අතර එදිනම රු. 200 000/= ක බැංකුණයක් හා රු. 100 000/= ණයහිමියන් පවතී. 2019.12.31 දිනට අයිතිකරුගේ හිමිකම කොපමණ ද?

06. i. ''ඔබ පාසලේ ආපනශාලාවක් පවතවාගෙන යන්නේ යැයි සිතන්න.'' එම ආපනශාලාවේ සිදුවන ගිණුම්කරණයේ දී සැලකිල්ලට ගනු ලබන ගණුදෙනු 04 කට නිදසුන් දක්වන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

A -ව්‍යාපාරික ගණුදෙනු මුදලින් හෝ ණයටද සිදු විය හැකිය.

B -දක්ෂ හා පළපුරුදු කළමනාකරුවකු ව්‍යාපාරයකට බඳවා ගැනීම ගිණුම්කරණයේ දී සැලකිල්ලට ගනු ලබන ගණුදෙනුවකි.

C -කෙටි කාලයක් තුළ බේරුම් කල යුතු වගකීම් ජංගම වගකීම් ලෙස සලකයි.

D - ආදායම් වලින් වියදම් අඩුකළ විට ලැබෙන අගය ලාභය වේ.

iv. 2019.12.31 දිනට රණවීරගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් වල තිබූ අයිතම කිහිපයක් පහත දැක්වේ.

- ආයෝජන
- ණයහිමියෝ
- වරිපනම් ගාස්තු
- විදුලි ගාස්තු
- ප්‍රාග්ධනය
- ලී බඩු
- බැංකු ණය
- ණය ගැතියෝ
- බැංකු ණය පොළී
- ලද කොමිස්
- විකුණුම්
- බඩුතොගය
-

ඉහත අයිතම වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් යන ශීර්ෂ යටතේ වර්ග කර දක්වන්න.

07. i. අ) වත්කමක් යන්න නිර්වචනය කරන්න.

ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ දෙකක් දක්වන්න.

ii. ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

iii. පහත දැක්වෙන්නේ 'සඳරුවන්' ගේ ව්‍යාපාරයේ පොත්වලින් 2019.12.31 දිනට උපුටාගත් ශේෂ කිහිපයකි.

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් | 75 000 | බඩු තොගය | 85 000 |
| ගැනුම් | 60 000 | බැංකු ණය | 1 500 000 |
| ලැබූ කොමිස් | 3 000 | ණයහිමියෝ | 65 000 |
| වැටුප් | 40 000 | ගෙවූ කොමිස් | 4 500 |
| යන්ත්‍ර උපකරණ | 210 000 | විදුලිය ගාස්තු | 12 500 |
| ණයගැතියෝ | 20 000 | ලීබඩු | 40 000 |
| මෝටර් රථ | 1 200 000 | බැංකු අයිරාව | 50 000 |

ඉහත ශේෂ ඇසුරින්,

1. ජංගම වත්කම්
2. ජංගම වගකීම්
3. ජංගම නොවන වත්කම්
4. ජංගම නොවන වගකීම්
5. ආදායම්
6. වියදම් යනාදියෙහි

වටිනාකම දක්වන්න.

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමුවාර පරීක්ෂණය - 2020

### I පත්‍රය - ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංක | ප්‍රශ්න අංකය | පිළිතුරු අංක | ප්‍රශ්න අංකය | පිළිතුරු අංක | ප්‍රශ්න අංකය | පිළිතුරු අංක |
|---|---|---|---|---|---|---|---|
| 01 | **2** | 06 | **1** | 11 | **3** | 16 | **1** |
| 02 | **3** | 07 | **4** | 12 | **3** | 17 | **2** |
| 03 | **1** | 08 | **2** | 13 | **2** | 18 | **4** |
| 04 | **4** | 09 | **3** | 14 | **4** | 19 | **1** |
| 05 | **2** | 10 | **1** | 15 | **2** | 20 | **3** |

**(එකකට දෙක බැගින් ලකුණු 40)**

### II පත්‍රය - ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය

01. i. ඇඳුම් - ළමා ඇඳුම් **(ලකුණු 02)**

ii. ඒක පුද්ගල ව්‍යාපාර **(ලකුණු 02)**

iii.
- ඇඳුම් මැසීමේ පාඨමාලාවක් හදාරා තිබීම
- දක්ෂ හා පළපුරුදු සේවිකාවන් සිටීම **(කරුණු 02 ට ලකුණු 02)**

iv.
- අයිතිකරු / සපුමලී **(ලකුණු 02)**
- සේවිකාව

v. ආර්ථික පරිසරය **(ලකුණු 02)**

vi. රු. 80 000/= **(ලකුණු 02)**

vii.
- රෙදි මහන මැසිම **(ලකුණු 02)**
- රෙදිපිළි උපකරණ

viii. රු. 100 000/= (බැංකු ණය) **(ලකුණු 02)**

ix.
- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- සියලුම ලාභ අයිතිකරු සතු වීම
- තම දක්ෂතා උපරිමව යෙදිය හැකිවීම
- තීරණ ගැනීමේ ස්වාධීන බව ආදී ........ **(කරුණු 02 ට ලකුණු 02)**

x. හවුල් ව්‍යාපාර **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

02. i.
- භාණ්ඩ ඇණවුම් කිරීම
- මුදල් ගෙවීම
- ප්‍රචාරණය ආදී ............ **(කරුණු 02 ට ලකුණු 02)**

ii. ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. **(ලකුණු 02)**

iii.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • අත්‍යවශ්‍ය වීම<br>• පොදු විම<br>• සීමිත වීම<br>• නිර්මානය කළ නොහැකි විම | • අත්‍යවශ්‍ය නොවේ<br>• විවිධ වීම<br>• අසීමිත වීම<br>• නිර්මාණය කළ හැකි වීම |

**(කරුණු 02 ට ලකුණු 02)**

iV. A - සත්‍යයි

B - සත්‍යයි

C - අසත්‍යයි

D - සත්‍යයි **(කරුණු 04 ට ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

03. i. A - නෛතික පරිසරය

B - ගෝලීය පරිසරය

C - සැපයුම්කරුවෝ

D - තාක්‍ෂණික පරිසරය **(කරුණු 04 ට ලකුණු 02)**

ii. A - ප්‍රාග්ධනය

B - ව්‍යවසායකත්වය

C - භූමිය

D - ශ්‍රමය **(කරුණු 04 ට ලකුණු 02)**

iii. අ) රජයේ රෝහලක් ආසන්නයේ පිහිටීම
ආ) තරඟකරුවන් ආපනශාලා ඇරඹීම/ අමු ද්‍රව්‍ය සොයා ගැනීමේ අපහසුතාවය
**(ලකුණු 02)**

iv. අ)
- ප්‍රමාණවත් ලාභයක් ලැබීම
- ආයෝජන සුරක්ෂිතතාව වැනි කරුණු

ආ)
- ගුණාත්මක අමුද්‍රව්‍ය සැපයීම
- කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම වැනි කරුණු **(ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

04. i. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයකු
ii. පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශී වීම ව්‍යාපාර සංවිධානයක් වේ. **(ලකුණු 02)**

iii.
- හිමිකාරීත්වය අනුව
- අරමුණ අනුව
- පරිමාණය අනුව **(කරුණු 02 ට ලකුණු 02)**

iv. අ) හවුල් ව්‍යාපාර

ආ)
- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
- වගකීම් බෙදීයාම
- සාමූහික තීරණ ගැනීම වැනි කරුණු **(ලකුණු 02)**

v.
- අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- විභාග දෙපාර්තමේන්තුව
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
- තැපැල් දෙපාර්තමේන්තුව වැනි පිළිගත හැකි දෙකක් **(ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

05. i. අ)
- හිමිකරුවන්
- ණයහිමියන්
- ගණුදනුකරුවන්
- රජය **(ලකුණු 02)**

ආ)
- ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න
- ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායක ද යන්න දැනගැනීමට
- නීතිමය අවශ්‍යතා ඉටුකිරීමට
- මූල්‍ය කටයුතු ක්‍රමවත් කිරීම **(කරුණු 02 ට ලකුණු 02)**

ii.
- අතිරේක ප්‍රාග්ධනයක් යෙදවීම
- ආදායම් ලැබීම **(ලකුණු 04)**

iii. අයිතිකරුගේ හිමිකම = මුළු වත්කම් - මුළු වගකීම්
= 1 000 000 - 200 000 - 100 000
= 1 000 000 - 300 000
= 700 000/= **(ලකුණු 04)**

**(මුළු ලකුණු 12)**

06. i. ඕනෑම ගණුදෙනු 04 කට **ලකුණු 04**

ii.
A - සත්‍යයි
B - අසත්‍යයි
C - සත්‍යයි
D - සත්‍යයි **(ලකුණු 02)**

iii.

| වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|
| ආයෝජන<br>ණය ගැතියෝ<br>බඩුතොගය<br>ලී බඩු | බැංකු ණය<br>ණයහිමියෝ | ප්‍රාග්ධනය | ලද කොමිස්<br>විකුණුම් | විදුලි ගාස්තු<br>බැංකු ණය පොලී<br>වරිපනම් ගාස්තු |

**(අයිතම 12 ට ලකුණු 06)**

**(මුළු ලකුණු 12)**

07. i. අ) අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වන අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරය විසින් පාලනය කෙරෙන සම්පත් **(ලකුණු 02)**

ආ)
- අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම
- ව්‍යාපාරයේ පාලනවට යටත් වීම
- අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

**(කරුණු 02 ට ලකුණු 02)**

ii. ජංගම වත්කම් සාමාන්‍යයෙන් කෙටි කාලීන ව පාවිච්චි කිරීම, විකිණීම හෝ මුදල් බවට පත් වීම සිදුවන අතර ජංගම නොවන වත්කම් දිගු කාලීනව ප්‍රයෝජනයට ගත හැකි වේ. යන අදහසට **(ලකුණු 02)**

iii. 1. ජංගම වත්කම්

| | |
|---|---|
| ණයගැතියෝ | 20 000 |
| බඩු තොගය | 85 000 |
| | රු. 105 000 |

2. ජංගම වගකීම්

| | |
|---|---|
| ණයහිමියෝ | 65 000 |
| බැංකු අයිරාව | 50 000 |
| | රු. 115 000 |

3. ජංගම නොවන වත්කම්

| | |
|---|---|
| යන්ත්‍ර උපකරණ | 210 000 |
| මෝටර් රථ | 1 200 000 |
| ලීබඩු | 40 000 |
| | රු. 1 450 000 |

4. ජංගම නොවන වගකීම්

| | |
|---|---|
| බැංකු ණය | 1 500 000 |
| | රු. 1 500 000 |

5. ආදායම්

| | |
|---|---|
| විකුණුම් | 75 000 |
| ලැබූ කොමිස් | 3 000 |
| | රු.78 000 |

6. වියදම්

| | |
|---|---|
| ගැනුම් | 60 000 |
| වැටුප් | 40 000 |
| ගෙවූ කොමිස් | 4 500 |
| විදුලිය ගාස්තු | 12 500 |
| | රු. 117 000 |

**(එක් ශීර්ෂයකට ලකුණු 01 බැගින් ලකුණු 06)**

**(මුළු ලකුණු 12)**